# අත්හැර දැමූ පරණ විද්‍යාගාරයේ සිට ප්‍රබල අන්තකර්රණ අධ්‍යාපනයක් කරා




"අපේ පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයේ සිටින විශේෂ අවශ්‍යතා ඇති සෑම සිසුවෙකුටම උපකාර කිරීම සඳහා අපි මිතුරු කණ්ඩායම් සංවිධානය කර තිබෙනවා," යි කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාථමික පාසලකදී අපට හමුවූ ඉතා උද්‍යෝගිමත් විදුහල්පතිවරයෙක් පැවසීය. "ඔවුන් පාසලට පැමිණෙන විට, විවේක කාලයේදී සහ පාසල අවසන්ව ගෙදර යනකොට ඒ මිතුරු මිතුරියන් ඇවිත් උදව් අවශ්‍ය නම් ලබාදෙනවා.බොහෝ විශේෂ අධ්‍යාපන සිසුන්ට තමන්ගේ කටයුතු තනිවම කරගන්නට පුළුවන්. ඒ වුණත්, මේ ක්‍රියාවෙන් සියලුම සිසුන් අතර සහකම්පනය, මිත්‍රත්වය සහ සාමූහිකත්වය වර්ධනය වෙනවා. විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ට පිළිගැනීමක් ලැබෙනවා. ඔවුන්ගේ සම වයසේ මිතුරන්ගෙන් ආදරය සහ සැලකිල්ල ලැබෙනවා. එසේ කිරීමෙන් සමානාත්මතාව සහ අන්තකර්රණය නිතැතින්ම භාවිතයට ගැනෙනවා. මේ ආකාරයෙන්, අන්තකර්රණ අධ්‍යාපනයේ අරමුණු සාක්ෂාත් කර ගත හැකියි."

අප එම පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයට යන විට පාසලේ විවේක කාලයයි. මිතුරු කණ්ඩායම් පැමිණ විශේෂ අධ්‍යාපන සිසුන් සමඟ මිතුරු වන අයුරු අපි දුටුවෙමු. ඩවුන්ස් සින්ඩ්‍රෝම්, ADHD, බහුවිධ දුබලතා සහ බුද්ධිමය දුබලතා සහිත සිසුන් පිරිසක් විශේෂ අධ්‍යාපන ඒකකයේ ඉගෙනුම ලබති. අපි ඔවුන් හමුවීමට යන විට ඔවුහු නතර්න පුහුණු සැසියකින් පසු දිවා ආහාරය ගන්නට සැරසෙමින් සිටියහ. තරුණ විශේෂ අධ්‍යාපන ගුරුවරියකගේ සහාය ඇතිව ජ්‍යෝෂ්ඨ ගුරුවරියක් ඔවුන්ට මඟ පෙන්වමින් සිටියහ. ඒ දෙදෙනාම මහත් උනන්දුවෙන් අප සමග සාකච්ඡා කළහ.

“මම ප්‍රාථමික පුහුණු ගුරුවරියක්. එහෙත්, මෙහි විශේෂ අධ්‍යාපන ඒකකයට ගුරුවරයෙකු නැති වෙලාවේ මම එය භාරගන්නට ඉදිරිපත් වුණා. කලාප අධ්‍යාපන කායර්ාලයෙන් මට අවශ්‍ය පුහුණුව ලබාදුන්නා. විදුහල්පතිතුමා විශාල සහයෝගයක් ලබා දුන්නා,” යැයි ජ්‍යෝෂ්ඨ ගුරුවරිය පැවසුවාය.

ජ්‍යෝෂ්ඨ ගුරුවරියගේ සහායට සිටි තරුණ ගුරුවරිය ඉතා මෑතකදී අධ්‍යාපන විද්‍යාපීඨයකින් අධ්‍යාපනය හමාර කළ අයෙකි. ඇය නිත්‍ය ගුරු මණ්ඩලයට අන්තග්‍රර්හණය වීමට පෙර වසරක සීමාවාසික ගුරු පුහුණුව සහිත තුන් අවුරුදු ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව විශේෂ අධ්‍යාපන විෂය ධාරාව ඔස්සේ සම්පූණර් කර ඇත. “අපි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේදී විශේෂ අධ්‍යාපනය පිළිබඳව හොඳින් පුහුණු වුණා. එහෙත්, විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සමඟ වැඩ කරන විට සෑම දිනකම වඩා ප්‍රායෝගික අංශ රාශියක් පිළිබඳ ඉගෙන ගන්නා බව මම සිතනවා. සෑම ළමයෙකුම විශේෂයි, ”යි ඇය පැවසුවාය.

"විශේෂ අධ්‍යාපන ඒකකය සඳහා අපට ප්‍රමාණවත් ඉඩකඩ සහිත පන්ති කාමරයක් තිබුණේ නැහැ. විදුහල්පතිතුමා මේ අත්හැරදමා තිබුණු කාමරය පිළිසකර කර අපට ලබා දුන්නා. මෙම විශේෂ අධ්‍යාපන ඒකකය පාසල අවට විශාල ප්‍රදේශයක සිසුන්ට සේවය සපයනවා. බොහෝ සිසුන් අඩු ආදායම්ලාභී පවුල්වල ළමයින්. තම දරුවන් දුර සිට පාසලට ප්‍රවාහනය කිරීම වැනි ගැටලුවලට මවුපියන්ට මුහුණ දීමට සිදුවෙනවා,"යි ජ්‍යෙෂ්ඨ ගුරුවරිය පෙන්වා දුන්නාය.

මෙම පාසල මෑතදී ප්‍රාථමික පාසලක් ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදී. ද්විතීයක පන්ති පැවති සමයේ භාවිත කරන ලද විද්‍යාගාරය අත්හැර දමා තිබුණු අතර වතර්මානයේදී විශේෂ අධ්‍යාපන ඒකකය පිහිටුවා ඇත්තේ එම අවකාශයේය. විදුහල්පතිවරයා ඒ පිළිබඳ මෙසේ පැවසීය: "මම කලාප අධ්‍යාපන කාර්යාලයෙන් අවසර අරගෙන විද්‍යාගාර තියෙන වෙනත් පාසල්වලට උපකරණ බෙදා දීලා කාමරය හිස් කරගත්තා. අපි කාමරය පිරිසිදු කළ නමුත් වෙනත් අලුත්වැඩියාවන් සඳහා ප්‍රතිපාදන තිබුණේ නැහැ. පාසල් ප්‍රජාව තීන්ත සහ සිමෙන්ති ආදිය සපයා ආධාර කළා. මව්පියන් ශ්‍රමදාන ඔස්සේ අලුත්වැඩියාවට උදව් කළා. ජයිකා ආයතනයේ කණ්ඩායමක් පාසලට පැමිණි විට අපට කාපට් එකක් ලබා දිය හැකිදැයි අපි විමසුවා. ඔවුන් අපට බිම ටයිල් අතුරාගැනීමට උදව් කළා. විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ට එය ඉතා සුවපහසුයි."

විදුහල්පතිවරයා අනෙකුත් වැඩිදියුණු කිරීම් සඳහා අරමුදල් රැස් කිරීමට උත්සාහ කරමින් සිටියි. එතෙක් ඇවිදීමේ දුබලතා සහිත සිසුන්ගේ පහසුව සඳහා තාවකාලික අත්වැටක් සකස් කර ඇත.

පාසලේ 5 ශ්‍රේණිය දක්වා පමණක් පන්ති පැවැත්වුණ ද එම වයසට වැඩි විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා පාසල අඛණ්ඩව සේවා සපයයි. "විශේෂ අධ්‍යාපන සිසුන්ට අධ්‍යාපනය මගහැරීම වැළැක්වීම සඳහා 5 ශ්‍රේණියෙන් පසු වෙනත් පාසලකට යාමට නොහැකි සිසුන්ව අප මෙම විශේෂ අධ්‍යාපන ඒකකයේ තබාගෙන කළමනාකරණය කරනවා. හැකි සෑම විටම අපි ඔවුන්ව 5 ශ්‍රේණිය සමඟ ඒකාබද්ධ කරනවා," යි පාසලේ අන්තකර්රණ අධ්‍යාපන සම්බන්ධීකාරක ගුරුවරිය පැහැදිලි කළාය.

"අපි විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සමහර සිසුන් 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් වන මට්ටමට දියුණු කළා. ඔවුන් දැන් ඉගෙන ගන්නේ නගරයේ ජාතික පාසලේ සාමාන්‍ය පන්තිවලයි. අවාසනාවකට එම පාසලට ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂ අධ්‍යාපන ඒකකයක් නැහැ. අපි ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා පාසල් බලධාරීන්ට දන්වා තිබෙනවා. ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් ඔවුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා," යැයි විදුහල්පතිවරයා පැවසීය.

විශේෂ අධ්‍යාපන ඒකකයේ ඉගෙනුම ලබන සිසුන්ට අමතරව තවත් විශේෂ අවශ්‍යතා ඇති සිසුන් කිහිප දෙනෙකු සාමාන්‍ය පන්තිවල තම සම වයසේ මිතුරන් සමඟ ඉගෙනුම ලබති. ගුරුවරුන් ඔවුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන අතර පාසලේ අන්තකර්රණ අධ්‍යාපන සම්බන්ධීකාරක ගුරුවරියගේ මගපෙන්වීම ඇතිව ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට පාසල උපරිම වශයෙන් උත්සාහ කරයි.

"උදාහරණයක් ලෙස, කිසියම් හේතුවක් නිසා කතා කිරීම ප්‍රතික්ෂේප කරන සිසුවියක් 4 ශ්‍රේණියේ ඉගෙනුම ලබනවා. ඇයගේ වෛද්‍ය සහ සමාජීය පසුබිම අධ්‍යයනය කළ අපට පෙනී ගියේ ඇයට ශ්‍රවණාබාධ හෝ කථන දුබලතා නොමැති බවයි. අපි ඇයට මනෝ සමාජයීය සහය ලබා දෙනවා. ඇය දැන් දියුණු වෙමින් සිටිනවා," යි අන්තකර්රණ අධ්‍යාපන සම්බන්ධීකාරක ගුරුවරිය පැවසුවාය.

ඉදි කිරීම් සිදු වෙමින් පවතින අලුත් ව්‍යාපෘතියක් විදුහල්පතිතුමා අපට පෙන්නුවේය.. "අපගේ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් තම සිසුන්ගේ අධ්‍යයන කුසලතා ගොඩනැගීමට අමතරව, එදිනෙදා කටයුතු තමන් විසින්ම කරගෙන යාමට ද පුහුණු කරනවා. මේ රෙදි සෝදන ස්ථානයක් සකස් කර තිබෙන්නේ විශේෂයෙන්ම තමන්ගේ ඇඳුම් තමන්ම සෝදා වේලාගැනීමේ කුසලතා ලබා දීමටයි," යි විදුහල්පතිවරයා පැවසීය.

විශේෂ අධ්‍යාපන ගුරුවරු සිසුන්ට ඔවුන්ගේ පරිසරය සහ බඩු බාහිරාදිය පිළිවෙලට හා ආරක්ෂිතව තබා ගැනීමට පුහුණු කරති. පාසල විසින් විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ට ඔවුන්ගේ සම වයසේ මිතුරන් සමඟ එක්ව ඉගෙනගත හැකි ආරක්ෂිත සහ සැලකිලිමත් පරිසරයක් නිමර්ාණය කර දී ඇත. මෙම කුඩා පාසලේ ඇති අවම පහසුකම් උපයෝගී කරගනිමින් විදුහල්පතිවරයාගේ නායකත්වය සහ ගුරුවරුන්ගේ කැපවීම ඔස්සේ සාරවත් අධ්‍යාපන පරිසරයක් නිමර්ාණය කර තිබෙන අයුරු අපි දුටුවෙමු.